පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය-බස්නාහිර පළාත

## මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (බස්නාහිර පළාත)

## තනතුරු පුරප්පාඩු

මෙම අධිකාරියේ පුරප්පාඩුව පවතින මතු දැක්වෙන තනතුරු සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීම පිණිස සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | වාර්ෂික වැටුප් පරිමාණය (රු.)* | වයස 2026.06.15 දිනට (අවුරුදු)** |
|---|---|---|---|
| 01.නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(මූල්‍ය) HM 1-1 | 01 | 140,640 – 15 X 4,100 – 202,140 | 35 ට නොඅඩු 55 ට නොවැඩි |
| 02.නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(පරිපාලන) HM 1-1 | 01 | 140,640 – 15 X 4,100 – 202,140 | |
| 03.ගණකාධිකාරී MM 1-1 | 01 | 91, 690– 10X 2, 480– 15X 3, 450– 168,240 | 22 ට නොඅඩු 45 ට නොවැඩි |
| 04.ප්‍රාදේශීය කළමණාකරු MM 1-1 | 01 | 91, 690– 10X 2, 480– 15X 3, 450– 168,240 | |
| 05.තාක්ෂණික නිලධාරී JM 1-1 | 01 | 72, 650– 10X 1, 360– 18X 2, 040– 122,970 | |
| 06.ගිණුම් නිලධාරී JM 1-1 | 03 | 72, 650– 10X 1, 360– 18X 2, 040– 122,970 | |
| 07.පරිපාලන නිලධාරී(පරිපාලන) JM 1-1 | 01 | 72, 650– 10X 1, 360– 18X 2, 040– 122,970 | |
| 08.පරිපාලන නිලධාරී(මෙහෙයුම්) JM 1-1 | 01 | 72, 650– 10X 1, 360– 18X 2, 040– 122,970 | |
| 09.ස්ථාන භාර නිලධාරී MA 1-1 (බස්නැවතුම්පළ සේවය සඳහා) | 10 | 46,220 -10 X 540-07 X 630-04 X 890 -20 X 1,190 -83,390 | 18 ට නොඅඩු 45 ට නොවැඩි |
| 10.රියදුරු උපදේශක MA 1-1 | 04 | 46,220 -10 X 540-07 X 630-04 X 890 -20 X 1,190 -83,390 | |

* වැටුප් පරිමාණ සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි විධිවිධාන බලපැවැත්වේ.

** උපරිම වයස් සීමාවන් අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.

## බඳවා ගැනීමේ සුදුසුකම්

### 01.නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(මූල්‍ය) HM 1-1 : පුරප්පාඩු 01

**බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U .G .C .) විසින් පිළිගනු ලබන ප්‍රථම උපාධිය හෝ ව්‍යාපාර /රාජ්‍ය පරිපාලනය ,කළමනාකරණය ,ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ B.Sc.(විශේෂ) උපාධිය සමඟ ගණකාධිකරණ / විගණන ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක් (Masters') සමඟ රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ගණකාධිකරණ / විගණන ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර පහළොවක (15 ) පළපුරුද්ද ,

හෝ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ (ICASL) හෝ එක්සත් රාජධානියේ (UK)කළමනාකරණ ගිණුම්කරණය පිළිබඳ වරලත් ආයතනයේ (CIMA ) හෝ සහතිකලත් වරලත් ගණකාධිකරණ ආයතනයේ (ACCA) මූල්‍ය/ගිණුම්කරණය/විගණනය සඳහා සම්පූර්ණ වෘත්තීයමය සුදුසුකම සමඟ රාජ්‍ය හෝ පිළිගත් පෞද්ගලික අංශයේ කළමනාකරණ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15 ) සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

කළමනාකරු සේවා ගණයේ පළමුවන ශ්‍රේණියේ අදාළ තනතුරක අවම වශයෙන් ලද වසර පහක (5) සතුටුදායක සේවා පළපුරුද්ද

### 02.නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(පරිපාලන) HM 1-1 : පුරප්පාඩු 01

**බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U .G .C .) විසින් පිළිගනු ලබන ප්‍රථම උපාධිය හෝ ව්‍යාපාර /රාජ්‍ය පරිපාලනය හෝ වාණිජ්‍යය පිළිබඳ B.Sc.(විශේෂ ) උපාධිය සහ පිරිස් / මානව සම්පත් (HR ) කළමනාකරණ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුකමක් (Masters) සමඟ ප්‍රථම උපාධිය ලැබීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක ,මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් ලද වසර පහළොවක(15) සේවා පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්

කළමනාකරු සේවා ගණයේ පළමුවන ශ්‍රේණියේ අදාළ තනතුරක අවම වශයෙන් ලද වසර පහක (5) සතුටුදායක සේවා පළපුරුද්ද

## 03.ගණකාධිකාරී MM 1-1: පුරප්පාඩු 01

බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්

ව්‍යාපාර/රාජ්‍ය පරිපාලනය ,ගණකාධිකරණය ,වාණිජ්‍යය හෝ කළමනාකරණය සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) මගින් පිළිගනු ලබන ප්‍රථම උපාධිය

හෝ

ICASL අන්තර්මාධ්‍ය සහතිකය / ආවසරික II සහතිකය / CIMA හෝ ACCA හි තෙවන කොටස (Part III) සහතිකය

හෝ

ශ්‍රී ලංකා තාක්ෂණික විද්‍යායතනය මගින් පිරිනැමෙන 'ගිණුම්කරණය සඳහා වන උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA ) හෝ ගිණුම්කරණය විෂයක් වශයෙන් ඇතුලත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) විසින් පිළිගැනෙන උපාධිය

සමඟ

රාජ්‍ය සංස්ථාවක ,මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ගණකාධිකරණ/විගණන ක්ෂේත්‍රයක ලද වසර තුනක (3) පශ්චාත් සේවා පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්

කනිෂ්ඨ කළමනාකරු සේවා ගණයේ (ගිණුම් / විගණන නිලධාරි ) 1 වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් ලද වසර පහක (5) සතුටුදායක සේවා පළපුරුද්ද.

## 04.ප්‍රාදේශීය කළමණාකරු MM 1-1 : පුරප්පාඩු 01

බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්

ව්‍යාපාර / රාජ්‍ය පරිපාලනය, ප්‍රවාහනය හා සැපයුම් සේවා ,මානව සම්පත් කළමනාකරණය (HRM), වාණිජ්‍යය, ඉංජිනේරු විද්‍යාව සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C) මගින් පිළිගනු ලබන ප්‍රථම උපාධිය සහ සංස්ථාවක,මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් ලද වසර තුනක (3) පශ්චාත් සේවා පළපුරුද්ද.

**සැ. යු. මහජන සම්බන්ධතා සහ ප්‍රවාහන සේවා පිළිබඳව ලබා ඇති විශිෂ්ඨ නිපුණතාවය අත්‍යාවශ්‍යය.**

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්

කනිෂ්ඨ කළමනාකරු සේවා ගණයේ 1 වන ශ්‍රේණියේ තනතුරක අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් ලද වසර පහක (5) සතුටුදායක සේවා පළපුරුද්ද.

**සැ.යු: ක්ෂේත්‍ර කටයුතු පිළිබඳ පූර්ව සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ.**

## 05.තාක්ෂණික නිලධාරී JM 1-1: පුරප්පාඩු 01

බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්

සිවිල් ඉංජිනේරු විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, ප්‍රමාණ සමීක්ෂණ, සංඛ්‍යාන විද්‍යාව, ප්‍රමාණාත්මක ශිල්ප ක්‍රම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C) මගින් පිළිගනු ලබන ප්‍රථම උපාධිය සහ රජයේ දෙපාර්තුමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක,මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වශයෙන් ලද වසරක (1) පශ්චාත් සේවා පළපුරුද්ද

## 06. ගිණුම් නිලධාරී JM 1-1: පුරප්පාඩු 03

බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්

ව්‍යාපාර පරිපාලනය / රාජ්‍ය පරිපාලනය ,ගණකාධිකරණය ,වාණිජ්‍යය හෝ කළමනාකරණය ,ආර්ථික විද්‍යාව සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) මගින් පිළිගනු ලබන ප්‍රථම උපාධිය

හෝ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ Licentiate/ Intermediate සහතිකය

හෝ

CIMA / ACCA හි III වන කොටස (Part - III) සාමාර්ථය

සමඟ

රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක/මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ගිණුම්කරණ/ විගණන ක්ෂේත්‍රයේ අවම වශයෙන් ලද වසරක (01) පශ්චාත් සේවා පළපුරුද්ද.

__අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්__

කළමනාකරණ සහකාර සේවා ගණයේ 1 වන ශ්‍රේණියේ තනතුරක ගිණුම්කරණ/විගණන ක්ෂේත්‍රවල අවම වශයෙන් ලද වසර පහක (5) සතුටුදායක සේවා පළපුරුද්ද.

## 07.පරිපාලන නිලධාරී(පරිපාලන) JM 1-1 : පුරප්පාඩු 01

__බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්__

ව්‍යාපාර / රාජ්‍ය පරිපාලනය, වානිජ්‍ය, මානව සම්පත් කළමනාකරණය, පිරිස් කළමනාකරණය,වානිජ්‍යවේදය සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C) මගින් පිළිගනු ලබන ප්‍රථම උපාධිය සහ රජයේ දෙපාර්තුමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක/මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වශයෙන් ලද වසරක (1) පශ්චාත් සේවා පළපුරුද්ද.

__අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්__

කළමනාකරණ සහකාර සේවා ගණයේ 1 වන ශ්‍රේණියේ තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් ලද වසර පහක (5) සතුටුදායක සේවා පළපුරුද්ද.

## 08.පරිපාලන නිලධාරී(මෙහෙයුම්) JM 1-1 : පුරප්පාඩු 01

__බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්__

ව්‍යාපාර / රාජ්‍ය පරිපාලනය, වානිජ්‍ය, සිවිල් ඉංජිනේරු විද්‍යාව, සංඛ්‍යාන විද්‍යාව, කළමනාකරණය, ප්‍රවාහනය සහ සැපයුම් සේවා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.(U.G.C) මගින් පිළිගනු ලබන ප්‍රථම උපාධිය සහ රජයේ දෙපාර්තුමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ්‍ය ආයතනයක අවම වශයෙන් වසරක (1) පශ්චාත් සේවා පළපුරුද්ද

__අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්__

කළමනාකරණ සහකාර සේවා ගණයේ 1 වන ශ්‍රේණියේ තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් ලද වසර පහක (5) සතුටුදායක සේවා පළපුරුද්ද

## 09.ස්ථාන භාර නිලධාරී MA 1-1 : පුරප්පාඩු 10 (බස් නැවතුම්පළ සේවය සඳහා)

__බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්__

එක් වරකදී පහත සඳහන් විෂයයන් ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් (4) සහිතව අ.පො.ස.(සා.පෙ.) විභාගය විෂයයන් හයකින් සමත්ව තිබීම

i. සිංහල / දෙමළ
ii. ඉංග්‍රීසි භාෂාව
iii. ගණිතය

**සහ**

අ.පො.ස.(උ.පෙ.)විභාගයේ දී (සාමාන්‍ය දැනුම ප්‍රශ්න පත්‍රයට අමතරව) විෂයයන් තුනකින් සමත්ව තිබීම.

__අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්__

(පහත සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික පුහුණු සහ ප්‍රාථමික නුපුහුණු සේවා ගණ වලට අයත් අභ්‍යන්තර සේවකයෝ අයදුම් කිරීම සඳහා සුදුස්සෝ වෙති.)

පහත සඳහන් විෂයයන් ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් (4) සහිතව අ.පො.ස.(සා.පෙ.) විභාගය විෂයයන් හයකින් සමත්ව තිබීම

i. සිංහල / දෙමළ
ii. ඉංග්‍රීසි භාෂාව
iii. ගණිතය

**සහ**

කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයට පහළින් වන සේවා ගණයකට අදාළ __ස්ථිර තනතුරක__ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම

## 10.රියදුරු උපදේශක MA 1-1 : පුරප්පාඩු 04

__බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්__

එක් වරකදී පහත සඳහන් විෂයයන් ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් (4) සහිතව අ.පො.ස.(සා.පෙ.) විභාගය විෂයයන් හයකින් සමත්ව තිබීම

i. සිංහල / දෙමළ
ii. ඉංග්‍රීසි භාෂාව
iii. ගණිතය

**සහ**

අ.පො.ස.(උ.පෙ.)විභාගයේ දී (සාමාන්‍ය දැනුම ප්‍රශ්න පත්‍රයට අමතරව) විෂයයන් තුනකින් සමත්ව තිබීම.

**සහ**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු රියදුරු උපදේශක බලපත්‍රය / ප්‍රවීනතා සහතිකය ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

(පහත සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික පුහුණු සහ ප්‍රාථමික නුපුහුණු සේවා ගණ වලට අයත් අභ්‍යන්තර සේවකයෝ අයදුම් කිරීම සඳහා සුදුස්සෝ වෙති.)

පහත සඳහන් විෂයයන් ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් (4) සහිතව අ.පො.ස.(සා.පෙ.) විභාගය විෂයයන් හයකින් සමත්ව තිබීම

i. සිංහල / දෙමළ
ii. ඉංග්‍රීසි භාෂාව
iii. ගණිතය

සහ

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු රියදුරු උපදේශක බලපත්‍රය / ප්‍රවීනතා සහතිකය ලබා තිබීම.

සහ

කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයට පහළින් වන සේවා ගණයකට අදාළ **ස්ථිර තනතුරක** අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම

## බඳවා ගැනීමේ ක්‍රමවේදය

සියළුම බඳවා ගැනීම් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සිදුකෙරේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ආකාරය පහත පරිදි වේ.

| නිර්ණායකය | ලකුණු ප්‍රමාණය |
|---|---|
| අදාළ අමතර පළපුරුද්ද සඳහා | 30 |
| අදාළ අමතර සුදුසුකම් සඳහා | 30 |
| වෙනත් කාර්යසාධන / ජයග්‍රහණ | 15 |
| සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධන මට්ටම | 25 |
| **මුළු ලකුණු** | 100 |

## පත්වීමේ ස්වභාවය

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් රහිතය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

## සේවා කොන්දේසි සහ පොදු විධිවිධාන

සෑම අයදුම්කරුවෙක්ම ,

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර බස්නාහිර පළාත තුළ අවම වශයෙන් වසර තුනක (3) ස්ථිර පදිංචිය සනාථ කල යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම බස්නාහිර පළාත තුල ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට අවශ්‍ය කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත අයකු විය යුතුය.
iv. තෝරාගැනෙන බාහිර අයදුම්කරුවන් රාජකාරී භාරගත් දින සිට වසර 03 ක පරිවාස කාලයකට යටත් කෙරෙන අතර රාජ්‍ය සේවයේ දැනටමත් ස්ථිර කරනු ලැබ ඇති අයදුම්කරුවන් වසරක වැඩ බැලීමේ කාලයකට යටත් කෙරෙනු ඇත.
v. සෑම සේවකයෙක්ම සේවක අර්ථ සාධක අරමුදලට 8% කින් දායක විය යුතු අතර,අධිකාරිය මගින් 12% ක් බැර කරනු ලැබේ.තවද සේවක භාරකාර අරමුදලට අධිකාරිය මගින් 3%ක් බැර කරනු ලැබේ.
vi. මීට අමතරව මාසික ජීවන වියදම් දීමනාව රු.17,800 ක් සහ චක්‍රලේඛ මගින් ඒ ඒ තනතුරට අදාලව අනුමත ප්‍රතිලාභ සඳහා හිමිකම් කියනු ඇත.

## අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සිය අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතිකවල තමා විසින්ම අත්සන් තබා සහතික කරන ලද ඡායාපිටපත් හා පදිංචිය සනාථ කරන ග්‍රාම සේවා සහතිකය තමා විසින් සකසා ගත් අයදුම්පතක් සමඟ අමුණා **2026.06.15** දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමුකළ යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියතු අයදුම්කරුවන් තම අංශ ප්‍රධානීන් මගින් අයදුම් කළ යුතුය. අසම්පූර්ණ අයදුම් පත්‍ර සහ අයදුම් පත්‍ර භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම් පත්‍ර භාරගනු නොලැබේ. අයදුම් පත්‍ර ලැබුණු බවට දන්වා එවනු නොලැබේ.

ගාමිණී ජාසිංහ
**සභාපති**
**බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය.**
**අංක 89,"රන්මහපාය",කඩුවෙල පාර,බත්තරමුල්ල.**
**2026.05.31**